Living the Lotus

Buddhism in Everyday Life

9
2025
VOL. 240

Living the Lotus
Vol. 240 (September 2025)

Senior Editor: Keiichi Akagawa
Editor: Sachi Mikawa
Copy Editors: Ruklanthi Palipana, Rajitha Maduranga

published by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124 FAX: +81-3-5341-1224
mail: living.the.lotus.rk-international@kosei-kai.or.jp

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමි ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සැම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සැම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙද ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවූ ලස්සන නෙලුම් මලක් සේ තම ජීවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවූ සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවූ අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.

ජීවිතයේ සරත් සමයේ සිට ශීත සමය සඳහා වන සූදනම

නිචිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය

ලෝක යුද්ධයෙන් මියගිය අය අනුස්මරණ උත්සවයේදී හඳුන්කූරු දල්වමින්
2024 අගෝස්තු මස 15 වනදින දයිසෙයිදෝවේදී

අහිමි දේ නොලැබෙමින්, හිමිදේ ලැබේවි

අපගේ ජීවිතය බොහෝ විට සෘතු හතරට උපමා කරනු ලබයි. ජීවිතයෙහි අංකුර දළුලා වැඩෙමින් වර්ධන වන තරුණ අවදිය වසන්ත සමයයි. ජවසම්පන්නව සමාජයෙහි ක්‍රියාශීලී වන මැදි වයස් අවදිය ගිම්හාන සමයයි. මිනිසුන් ලෙස පරිණත වී, සැදෑ සමය ගත කරමින් අස්වනු නෙලා ගනිමින්, ශීත කාලයට සුදනම් වන සැදෑ කාලය සරත් සමයයි. ජීවිතයේ ඵල ලබාගෙන ශාන්ත බවින් ජීවත් වෙමින්, අපගෙන් පසු ඵලදරන්නාවු බීජයන් නව වසන්ත සමයක දළුලන තුරු මග බලා සිටිමින් ජීවිතයේ අවසාන අවදිය ගත කරන ශීත සමයයි.

පුද්ගලයාට අනුව සංජානනය වෙනස් විය හැකි නමුත්, 'වසර 100 ක ආයු කාලයක් පවතින යුගය' ලෙස පැවසෙන වර්තමාන චින්තනය මත පදනම්ව ගත්කල, වයස අවුරුදු 25 දක්වා කාලය වසන්ත සමය ලෙසත්, එයින් පසුව වයස අවුරුදු 50 දක්වා කාලය ගිම්හාන සමය ලෙසත්, ඉන් ඉදිරියට වයස අවුරුදු 75 දක්වා කාලය සරත් සමය ලෙසත්, ඉන් පසුව එළඹෙන කාලය ශීත සමය ලෙසත් සැලකීම හොඳ බව මම සිතමි.

කෙසේ වුවද, මෙම සෘතු හතර අතරින් සරත් සමයේ සිට ශීත සමය දක්වා වන කාලයේ එතරම් සජීවි බවක් නොපවතියි. ශාක වල පත්‍ර වියැලී හැලෙමින්, සුළඟින් හා හිමෙන් වැහෙන, තනිකම මුසු කාලයක් ලෙස ප්‍රතිරූපයක් බොහෝදෙනා අතර ගොඩනැගී ඇතැයි සිතමි.

කෙසේ වුවද, සමාන කොටස් හතරකින් ජීවිතය බෙදෙන පුරාණ ඉන්දියානු 'සතර ආශ්‍රම ධර්ම' සංකල්පයට අනුව, සරත් සමයට ගැලපෙන 'වානප්‍රස්ථ' යනු ජීවිතයේ ස්වර්ණමය යුගය වන අතර, එය විවිධ බැඳීම්වලින් කරදරයට පත් නොවී, ජීවිතයේ අවසාන අදියර වන 'සන්‍යාසි' අවදිය තෘප්තිමත්ව සහ සතුටින් ගත කිරීමට සූදනම් විය හැකි කාලයක් ලෙස ඉගැන්වෙනු ලැබේ.

'අහිමි දේ නොලැබෙමින්, හිමිදේ ලැබේවි සරත් සමයේ පැහැබර අහස මෙන්' (රියූතා ඊද) යනුවෙන් කවියක් තිබේ. ජීවිතයේ සරත් සමය යනු අපට පෙරදී කරදරකාරී ලෙස හැඟුණු දෙවල් වලින් ක්‍රම ක්‍රමයෙන් නිදහස්ව, හදවත පුරවන දේවල් සහ අපේක්ෂාවන් මනසේ තබාගෙන, පැහැබර හැඟීමකින් ශීත සමයට පිවිසෙන කාලයයි.

කෙසේ වුවද, සැදෑ සමයේ අපි ජීවිතය ගත කරන විට ‘ඒ කාලයේ මෙහෙම කරන්න තිබුණා’ ලෙසින් ඉඳහිට පසුතැවිලි වන අවස්ථා පවතී. විශේෂයෙන්ම ජීවිතයේ අවසාන භාගයේ මෙවැනි සිතුවිලි නිතර ඇතිවීමට ඉඩ තිබේ. නමුත්, එම කණගාටුවීම් සහ පසුතැවීම් ද ජීවිතයේ ශීත කාලය වන අවසන් කාලයට පිවිසීම සඳහා වන ’ එලදවක්’ ලෙසට සිතමි.

සරත් සමයේදී අස්වනු නෙළන ලද පර්සිමන් සහ චෙස්නට් වල කහට ගතියට සහ කටුවලට අකමැති නම් එයින් ඔබට කිසිදු ප්‍රයෝජනයක් නොලැබෙයි. පර්සිමන් වල කහට ගතිය හා චෙස්නට් වල කටු පිරිච්ච කට්ට ගලවා, පිළියෙල කරගත් විට එය රසවත් ආහාරයකි. ඒ හා සමානවම, ජීවිතයේ කටුක අත්දැකීම් ‘අස්වැන්නක්’ කරගෙන ලබාගන්නාවූ ආධ්‍යාත්මික පෝෂණය ද, ජීවිතයේ අවසාන භාගය වන ශීත කාලයට මුහුණ දීම සඳහා වන ශක්තියකි. එයද සැදෑ කාලය වන සරත් සමයේ පමණක් ලබා ගත හැකි විශිෂ්ට අස්වැන්නක් ලෙස පැවසිය හැකිය.

ජීවිතයේ ශීත සමය යනු ඉගෙනුම් කාලයකි

මීට ආසන්න වශයෙන් වර්ෂ 2600කට පෙර වයස අවුරුදු 74දී මියගිය කොන්ෆියුසියස් තුමා ‘ඇනලෙක්ට්ස්’ හි ‘වයස අවුරුදු 50දී ස්වර්ගයේ කැමැත්ත වැටහේ. වයස අවුරුදු 60දී හොඳින් සවන් දේ. වයස අවුරුදු 70දී යෝග්‍යතාවයේ සීමාවන් ඉක්මවා නොයා හදවතේ ආශාවන් අනුගමනය කරනු ලබයි’ ලෙස තම ආධ්‍යාත්මික ගමන පිළිබඳව පවසා ඇත. ජීවිතයේ සරත් සමයේදී අපට අහසේ සහ පොළොවේ සහ සොබාදහමේ මූලධර්මයන් අවබෝධ වන අතර, මිනිසුන් පවසන දෙයට සවන් දෙන විට, එම මූලධර්ම හදවතට ළඟා වේ. අප ජීවිතයේ ශීත සමයට ඇතුල් වන විට හදවතෙහි අභිමතය පරිදි කටයුතු කලද ස්වභාවයෙන්ම ආචාරධර්ම සහ නීතිරීතිවලින් බැහැර වීමක් සිදු නොවන බවට පැවසේ.

මම මේ වන විටත් ශීත සමයේ මැද භාගයේ සිටින නමුත්, මිනිසෙකු ලෙස මෙතරම් පරිණත මානසිකත්වයකට ළඟා වීම කල නොහැක්කකි. තවද, එවක සහ වර්තමානයේ සාමාන්‍ය ආයු අපේක්ෂාව සලකා බලන විට, කොන්ෆියුසියස් තුමාගේ වයස අවුරුදු 70 යනු වර්තමානයේ එය වයස අවුරුදු 110 පමණ වේ. මම වයස අවුරුදු 80ගණන්වල පසුවන පුද්ගලයෙකු ලෙස මටද ඉගෙනීමට තව බොහෝ දේ ඇති අතර, මා නොදන්නා සහ නොවැටහෙන දේවල්ද බොහෝමයක් ඇත. එම අර්ථයෙන් මම අවංකවම තවදුරටත් ඉගෙනීමට කැමැත්තෙමි.

මෙවැනි ආශාවන් සෑම පුද්ගලයෙකුටම ඇති සහජ බුද්ධියක් වැනිය. තවද, ඉගෙනීමට ආශාවක් ඇත්නම් කුමන වයසක සිටියද අලුත් දේවල්වලට මුහුණ දිය හැකි වේ. එයින් ලබා දෙන ප්‍රීතිය සහ උද්යෝගය ජීවත් වීමට ශක්තිය ලබා දෙන අතර ජීවිතයේ අවසාන භාගය වන ශීත සමය ගත කිරීමේ ප්‍රීතියද ලබා දෙයි.

ඒ සඳහා සෞඛ්‍යයද වැදගත් වන අතර, ‘නාගසකි සාම ප්‍රතිමාව’ හේතුවෙන් ප්‍රසිද්ධ වූ මූර්ති ශිල්පියෙකු වන සෙයිබෝ කිතමුරා මහතා වයස අවුරුදු 100දී, වයස අවුරුදු 77ක් වූ නිර්මාතෘ තුමා සමඟ කල සංවාදයකදී, දිගු සහ සෞඛ්‍ය සම්පන්න ජීවිතයක රහස වන්නේ, ‘කෝප නොවී සිටීම සහ දේවල් පිළිබඳව නොරිස්සුම් ගතියෙන් නොසිටීමයි’ ලෙස පවසා ඇත. නිර්මාතෘ තුමා විසින් ‘බොරු නොකීම’ ද වැදගත් සේ ප්‍රතිචාර දැක්වූ විට ‘බොරු නොකීමෙන් මනස පිරිසිදු වන අතර එය අපගේ සෞඛ්‍යයට හිතකරයි’ යනුවෙන් කිතමුරා මහතාගෙන් පිළිතුරු ලැබුණි. නිර්මාතෘ තුමාගේ සමරු සටහන් ගැනීමට පැමිණෙන පිරිසටද ‘තම මනස පිරිසිදු කරගෙන දිගු කලක් ජීවත් වන්න’ ලෙස ලියමින්, දෛනික ආකල්ප ගැන හෙළිකර තිබේ.

ඉගෙනීම ගැඹුරු කිරීමට උත්සාහ කිරීම, අව්‍යාජ වීම සහ අවංක වීම යන ආකල්පය තරුණ පරම්පරාවට ආදර්ශයක් වනු නිසැකය. මින් ඉදිරියට ඉගෙනීම ප්‍රගුණ කිරීම පිළිබඳව ලිපියකින් නැවත හමුවීමට බලාපොරොත්තු වෙමි.

‘කෝසෙයි’ සැප්තැම්බර් කලාපය ඇසුරිණි

දකුණු අප්‍රිකානු ජනතාවගේ සතුට වෙනුවෙන් බුදුන් වහන්සේගේ ධර්මය ඉගැන්වීම මගේ බලාපොරොත්තුවයි

ඇන්ඩෘ ක්‍රිස්ට් මහතා,
ඉතාලියේ රෝම ධර්ම ශාඛාව අනුබද්ධිත දකුණු අප්‍රිකානු ධර්ම මධ්‍යස්ථානය

රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධ වූයේ කවදාද කුමන හේතුවක් නිසාද?

මම 2013 අවුරුද්දේ මැයි මස රිෂ්ෂෝ කෝසෙයි කායි සාමාජිකත්වය ලබාගත්තා. මම දැනට දකුණු අප්‍රිකානු මහද්වීපයේ කෙලවර පිහිටා ඇති ජොහැන්ස්බර්ග් හි ජීවත් වන අතර, අවුරුදු 20 ක් පමණ ජපන් බෞද්ධ සංවිධානයක සාමාජිකයෙකුව සිටියා. එක් අවස්ථාවක එහි චින්තන ක්‍රමය පිළිබඳ ගැටළුවක් මතු වූ අතර, ඒ හේතුව නිසා මම එයි ඇත් වන්නට වූවා. නමුත් බුදු දහම ගැන මාතුල වූ උනන්දුව නිසාවෙන්, දිනක් අන්තර්ජාලය ඔස්සේ රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ වෙබ් අඩවිය මා නෙත ගැටුනු අතර එය දැකීමෙන් මා පුදුමයට පත් වූවා. එහි කෝෂෝ සමා නැගෙනහිර ජපානයේ භූමිකම්පාවකින් අවතැන් වූවන් සිටින ප්‍රදේශ වලට ගොස් ඔවුන්ගේ සුවය ප්‍රාර්ථනා කල අවස්ථාවක් වූවා. වෙබ් අඩවියේ ප්‍රවෘත්ති කියවීමෙන් පසුව මම ජපානයේ රිෂ්ෂෝ කෝසෙයි කායි මූලස්ථානයට කතා කලා. නමුත් අවාසනාවක මහත, දකුණු අප්‍රිකාවේ ධර්ම ශාඛාවක් නොමැති බව පැවසුවා. නමුත්, මාව රෝම මධ්‍යස්ථානයට (වර්තමාන රෝම ධර්ම ශාඛාවට) සම්බන්ධ කරනු ලැබූ අතර, එවකට මධ්‍යස්ථාන ප්‍රධානී කත්සුතොෂි මිසුමෝ (වර්තමාන හමකිතා ධර්ම ශාඛාවේ කියෝකයිචෝ) මහතා සමග මා කතා කලා.

පසුව මම වෙබ් අඩවිය ඔස්සේ ඉංග්‍රීසි භාෂාවෙන් සූත්‍ර පොතක් ලබා ගත් අතර උදෙ සවස සූත්‍ර සජ්ඣායනයද ආරම්භ කලා. එම වෙබ් අඩවියෙන්ම නිර්මාතෘ තුමා විසින් රචිත 'සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ අටුවාව' සහ *Invisible Eyelashes* යන පොත් ලබාගෙන කියවන්න පටන්ගත්තා. පසුව නිර්මාතෘ තුමා විසින් රචිත *Cultivating the Buddhist Heart* පොත සහ කෝෂෝ සමා විසින් රචිත *The Buddha in Everyone's Heart* පොත අන්තර්ජාල පොත් ලෙස මිලදී ගෙන කියවීම තුලින් ටිකෙන් ටික රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය ගැන අවබෝධ කර ගත්තා.

පසුව රෝම ධර්ම ශාඛාව සමග සම්භන්ධ වූයේ කෙසේද?

රෝම මධ්‍යස්ථානය මගින් පවත්වනු ලැබූ ඔන්ලයින් වැඩසටහන් වලට මා සම්බන්ධ වූ අතර, එහිදී ධර්ම මිතුරන් සමග නිචිකෝ නිවානෝ තුමාගේ මාසික ධර්ම පණිවිඩය සාකච්චා කරමින්, තව අවස්ථාවල අත්දැකීම් කතා පවත්වමින් හෝසා වටයන් පවත්වමින් එකිනෙකාගේ හැඟීම් හුවමාරු කර ගනිමින් කටයුතු කලා. මෙම ක්‍රියාකාරකම් කරගෙන යන අතරතුර, 2013 අවුරුද්දේ දෙසැම්බර් මාසයේදී, මගේ නිවසේ බුද්ධ රූපය තැම්පත් කිරීමට මධ්‍යස්ථාන ප්‍රධානී මිසුමෝ මහතා ජොහැන්ස්බර්ග් හි මගේ නිවසට පැමිණි අතර එය ඉතාමත් කෘතවේදී අවස්ථාවක් වූවා. මගේ මව සහ සහෝදර සහෝදරියන් 10 දෙනෙකු ඇතුලු පිරිසක් එම අවස්ථාවට සහභාගී වීම ගැන මම සතුටු වූවා. වයස වුරුදු 92 දී මිය ගිය මගේ මව මාත් සමගම ජීවත් වූවා. ඇය කිතුනු භක්තිකයෙකු වූ නමුත්, කිසියම් හේතුවක් නිසාවෙන් මම රිෂ්ෂෝ කෝසෙයි කායි සාමාජිකයෙකු වීම ගැන ඇය සතුටු වූවා. කොරෝනා වෛරසය හේතුවෙන් අන්තර්ජාලය ඔස්සේ බොහෝ වැඩසටහන් පැවැත් වූ බැවින්, ඇය ඒවාට උනන්දුවෙන් සහභාගී වූ අතර වැඩසටහන් අවසානයේ ඇගේ අදහස් මා සමග බෙදා ගත්තා.

රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ආකර්ශනීයම අංගය කුමක්ද?

රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය විවෘත මනසක් ඇති සංවිධානයක් වීම එහි හොඳම ආකර්ෂණයයි. විවිධ වටිනාකම් සහ විවිධ ආගම් පිළිගැනීමට සහ ඒවායේ පොදු කරුණු සොයා කටයුතු කිරීමට ඇති හැකියාව මම සැබැවින්ම අගය කරනවා. ජපානය තුල සහ ජාත්‍යන්තරව අන්තර් ආගමික සංවාද සහ සහයෝගීතාව ක්‍රියාකාරීව ප්‍රවර්ධනය කරන ආකාරය එයට හොඳම උදාහරණයයි.

ඇන්ඩෘ ක්‍රිස්ට් මහතා,

ඊලග කරුණෙන නම්, දිනපතා සූත්‍ර සජ්ජායනය මූලික පුහුණුව ලෙස ගෙන තිබීමයි. මම උදෑසන සහ සවස සූත්‍ර සජ්ජායනය කිරීමට විශාල වැදගත්කමක් ලබා දී තිබෙන අතර, එයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර යේ ඉංග්‍රීසි පරිවර්ථනයෙන් පරිච්ඡේදයක්ද එකතු කරනවා. එය මට මහත් සන්සුන් බවක් ගෙන එනවා. විශෙෂයෙන් උදෑසන සූත්‍ර සජ්ජායනය මම රැකියාවට යාමට කලින් සිදුකරන නිසා දවස ශක්තිමත් කරන අතර, විශ්වාසයෙන් දවස ආරම්භ කිරීමට එය උපකාරී වනවා. තවද, සූත්‍ර සජ්ජායනය තුලින් හිතවතුන් මිතුරන් සමග හොද සබදතාවයක් පවත්වාගැනීමට ප්‍රඥව ගැබෙන අතර, ඕනෑම අභියෝගයක් ජය ගැනීමට ඒවාට හොඳින් මුහුණ දීමට සහ තමන් ගැන අවබෝධ කර ගැනීමට හැකීවීම වැනි ආනිසංස මට ලැබී තිබෙනවා.

රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ඉගැන්වීම් වලින් ඔබ විශේෂයෙන් වැදගත් කොට සලකන කරුණු මොනවාද?

මම, නිවිකෝ නිවානෝ තුමාගේ මාසික ධර්ම පණිවිඩය මගේ ටැබ්ලට් එකට අන්තර්ජාලයෙන් ලබාගන්නා අතර උදෑසන සහ සවස ඒවා නැවත නැවත කියවීමට උත්සහ කරනවා. උදෑසන සූත්‍ර සජ්ජායනයෙන් පසු ධර්ම පණිවිඩය කියවීම සහ රැකියාව අවසන්ව නිවසට පැමිනි පසු සවස සූත්‍ර සජ්ජායනයෙන් පසු ධර්ම පණිවිඩය කියවීම දැන් දිනපතා පුරුද්දක් වෙලා. මෑතකදී, 'හදවත සහ මනස සංවර්ධනය' යන නිවිකෝ නිවානෝ තුමාගේ පණිවිඩය මා සිත් ගත් අතර, 'ප්‍රඥව මගේ නගුලයි, ලැජ්ජාව මගේ නගුල් අතයි' යන කවියෙන් අපගේ හදවත් ගුණ ධර්මයන්ගෙන් වගාකිරීමේ වැදගත්කම පෙන්වා දුන්නා. මට නිර්මාතෘ තුමාගේ සහ නිවිකෝ නිවානෝ තුමාගේ ඉගැන්වීම් ජීවිතයට අවශ්‍යම මාර්ගෝපදෙශයක් වී ඇති අතර, දිනපතා මා ගැන පසුවිපරම් කිරීමට එය මහත් පිටුවහලක්ව තිබෙනවා.

2024 අවුරුද්දේ රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ මූලස්ථානයට ගිය අරමුණ කුමක්ද?

මම දැනට ජොහැන්ස්බර්ග් වල ජීවත් වන අතර, ඒ වන තෙක් රෝම මධ්‍යස්ථානයේ වැඩසටහන් වලට ඔන්ලයින් ඔස්සේ සහභාගී වූවා පමණයි. එනිසා මගේ ප්‍රධාන ඉලක්කය වූයේ රිෂ්ෂෝ කෝසෙයි කායි මූලස්ථානයට ගොස් ධර්ම පුහුණුව, හෝසා පුහුණුව ලබාගැනීම ඒ ගැන අත්දැකීමක් ලබා ගැනීම සහ බුදු පිළිම වහන්සේ ලබාගැනීම මගේ විශාලම බලාපොරොත්තුව වූවා. බුදු දහම යනු තමාට පමණක් ප්‍රගුණ කිරීමට නොව, හැකි තරම් විශාල පිරිසකට කියාදීමට සහ සියලු දෙනා එක්ව සතුටු වීමට උගන්වන බව මම විශ්වාස කරනවා. එනිසා නැවත රටට ගොස් මූලස්ථානයෙන් ඉගෙනගත් දෑ ජීවිතයට එක් කරගෙන, විශ්වාසයෙන් හා ධෛර්යයෙන් බුදුන් වහන්සේගේ දහම අන් අයට කියාදීමට තරයේ අධිෂ්ඨාන කරගත්තා.

ඔක්තෝබර් මස මැද භාගයේ සති දෙකක පමණ කාලයක් පෞද්ගලික සංචාරයක් ලෙස මූලස්ථානය වන්දනාමාන කිරීමට ගියා. එහිදී දයිසෙදෝව ඇතුලත්ව මූලස්ථානය නැරඹීමට, නිර්මාතෘ තුමාගේ උපන්ගම වන නීගතාහි තෝකමචි ගම්මානය නැරඹීමට, ජාත්‍යන්තර උපදේශකයෙකු වන ආචාර්ය ඩොමිනික් ස්කරන්ජෙලෝ විසින් පැවැත්වූ බුදු දහම සහ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය පිළිබද දේශන වලට සහභාගී වූවා. මීට අමතරව නෙරීමා ධර්ම ශාඛාවෙන් සූත්‍ර සජ්ජායනයේ පුහුණුව, කනේ, මොකුෂෝ වාදනය කරන ආකාරය ඇතුලු කරුණු රාශියක් ප්‍රයෝගිකව පුහුණු වූ අතර එය මට වටිනා අත්දැකීමක් වූවා. නෙරීමා ධර්ම ශාඛාවේ සාමාජිකයින් සමග දන්සත් පෙරහැරටද සහභාගී වීමට හැකියාව ලැබුණා. ජපානය තුල ගත කාලයේ මගේ මනස ජලය උරාගන්නා ස්පොන්ච් එකක් මෙන් සෑම අවස්ථාවක යමක් ඉගෙනීමට ආශාවෙන් පිරී තිබුණා. තවද ඔක්තෝබර් මස 27 වන දින ජපානයෙන් පිටත් වීමට පෙර ජාත්‍යන්තර මූලස්ථානයේ අධ්‍යක්ෂක අකගවා මහතාගෙන් බුදු පිළිම වහන්සේ ලබා ගැනීමට අවස්ථාව හිමි වූ අතර, නොවැම්බර් මස 2 වන දින මධ්‍යස්ථාන ප්‍රධානී මිසුමො මහතා මගේ නිවසට පැමිණ බුද්ධ ප්‍රතිමාව තැම්පත් කරන උත්සවය පැවැත්වූවා.

අවසාන වශයෙන් දකුණු අප්‍රිකාවේ පළමු සාමාජිකයා ලෙස ක්‍රිස්ට් මහතාගේ අනාගත බලාපොරොත්තු සහ ඉලක්ක අප සමග බෙදගත හැකිද?

මගේ පෞද්ගලික ඉලක්කය, මමත්වය ඉවතට දමා කෝප නොවන ඉවසිලිමත් පුද්ගලයෙකු වීමයි. එදිනෙද ජීවිතයේ සබදතා සමග ගත් කල, අනෙක් අයගේ අදහස්

මුලථානයේදී අකගාවා මහතාගෙන් බුදු පිළිම වහන්සේ ලබාගනිමින්

Interview

ප්‍රතික්ෂේප නොකර මගේ හැඟීම් වලට අනුව අන් අයට දොස් පැවරීමකින් තොරව කෝපයට පත් නොවී කටයුතු කිරීම. සෑම කෙනෙකුටම සමසේ සලකන, අන් අයව හොඳින් පිළිගන්නා මාත් සමග සිටින මා වටා පිරිසට සැහැල්ලුවක් ගෙන එන පුද්ගලයෙකු වීම මගේ අරමුණයි. එය පරමාදර්ශයක් වන්නට පුළුවන් නමුත්, බුදු දහමේ උගන්වනේ එලෙස යැයි මම විශ්වාස කරනවා. එනිසා බුදු දහම ගැන සහ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ගැන ගැඹුරින් අධ්‍යනය කරන්න සහ මාව වර්ධනය කරගන්න බලාපොරොත්තු වනවා.

තවද රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ සාමජිකයෙකු ලෙස හැකිතාක් පිරිසකට ධර්මය බෙදා දීමට කටයුතු කරන අතර, නුදුරු අනාගතයේ දකුණු අප්‍රිකාව තුලද ධර්ම ශාඛාවක් පිහිටුවීමට මම බලාපොරොත්තු වනවා. මගේ නිවස දකුණු අප්‍රිකාවේ හෝසා පවත්වන අනු ශාඛාවක් ලෙස ගෙන හෝසාවටයන් පැවැත්වීමට ධර්ම සාකච්චාවන් කිරීමට හැකිනම් හදවතින්ම කෘතඥ වනවා. 1994 අවුරුද්දේදී දකුණු අප්‍රිකාව තුල වර්ණභෙද වාදය අහෝසි කලද ඓතිහාසික පසුබිම සහ අතීත බලපෑම් නිසා රට දරිද්‍රතාවය, පිරිහුනු මහජන ආරක්ෂාව සහ ඉහළ විරැකියාව යන ප්‍රධාන ගැටළු වලට මුහුණ දෙමින් බොහෝ පිරිස් දුක් විඳිමින් ජීවත්වනවා. නමුත් බුදු දහම රටවල්, සමාජයන් වෙනස් කරන බලවේගය වේයැයි මම සිතනවා. රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ඉගැන්වීම් මේ රටේ සහ සමාජයේ සාමය කෙරෙහි විශාල බලපෑමක් ඇති කරයි කියා මම විශ්වාස කරනවා.

ඔඑෂිකි පෙරහැරට සහභාගී වූ ක්‍රිස්ටි මහතා

රිෂ්ෂෝ කෝසෙයි කායි හැඳින්වීම

රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ පහසුකම්

ඕමෙ වල පිහිටි ධර්ම පුහුණු මධ්‍යස්ථානය හා නිර්මාතෘ තුමා උපන් ගමේ ධර්ම මන්දිරය



තෝකියෝහි ඕමෙ නගරයේ, සාමාජික තරුණ තරුණියන් සඳහා ධර්ම පුහුණු මධ්‍යස්ථානයක් ලෙස 1966 අවුරුද්දේ ඕමෙ පුහුණු ඩෝජෝව නිර්මාණය කරන ලදි. මෙයට හරිත වර්ණයෙන් වටවූ වනාන්තර පරිසරයක්, ගොඩනැගිලි දෙකක්, ක්‍රීඩා පිට්ටනියක් සහ බේස්බෝල් පිට්ටනියක් ඇතුලත්වනවා. වර්තමානය වනවිට එය සියලුම සාමාජිකයින් සඳහා ධර්ම පුහුණු මධ්‍යස්ථානයක් වී තිබෙනවා.

නිර්මාතෘ තුමා උපන් ස්ථානයේ ඩෝජෝව 1978 අවුරුද්දේ නීගතා ප්‍රාන්තයේ තෝකමචි නගරයේ සුගනුමානම් ගම්මානයේ ඉදිකර තිබෙන අතර, එය උපන් ගම්මානය සඳහායි. නිර්මාතෘ තුමාගේ, ප්‍රතිසංස්කරණය කරන ලද උපන් නිවස ඊට යාබදව පිහිටා තිබෙනවා.

දැනුමට යමක්

නිර්මාතෘ තුමාගේ 100 වන ජන්ම දිනය නිමිති කොටගෙන 2006 අවුරුද්දේ දී එතුමානන් උපත ලැබූ නිවස ප්‍රතිසංස්කරණය කරන ලදි. සුගනුමා වෙත ගියහොත් නිර්මාතෘ තුමා කෙතරම් දුෂ්කර ජීවිතයක් ගතකලාදැයි දැකගැනීමට හැකිලෙස එය නිර්මාණය කර තිබෙනවා.

※ කරුණාකර අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීමෙන් වළකින්න.

දේශිය සහ විදේශීය ධර්ම ශාඛාවන්





ඕනෑම අයෙකුට ඕනම වෙලාවක, ඕනම තැනකදී සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ඉගැන්වීම් ඉගෙනීමට, පුහුණු කිරීමට හැකි වන පරිදි රටපුරා ප්‍රදේශවල ධර්ම ශාඛා පිහිටුවා තිබෙනවා. අමෙරිකා එක්සත් ජනපදය, බ්‍රසීලය, එක්සත් රාජධනිය, තායිවානය, තායිලන්තය, ශ්‍රී ලංකාව, ඉන්දියාව, නේපාලය, බංගලාදේශය, දකුණු කොරියාව සහ තවත් රටවල ධර්ම ශාඛාවන් සහ හෝසා මධ්‍යස්ථාන ලෙස ශාඛාවන් පිහිටා තිබෙනවා.

ධර්ම ශාඛාවන් තුල සූත්‍ර සජ්ජායන උත්සවයන්, පුහුණු වැඩසටහන් සහ සම්මන්ත්‍රණ සඳහා පමණක් නොවන ඕනෑම අවස්ථාවක ඕනෑම ප්‍රශ්නයක් ගැටලුවක් කතා කිරීමට විසඳගනීමට ඇති ස්ථානයක් වන බැවින් නිවාඩුවක් තිබෙන ඕනම වෙලාවක් පැමිණ වන්දනා කරන්න හැකියි.

දැනුමට යමක්

සූත්‍ර සජ්ජායනය ආරම්භ කරන විට ප්‍රථමයෙන්ම 'බුද්ධත්වය ලැබූ ස්ථානය ගැන මෙනෙහි කිරීම ලෙස' වැකියක් කියවනු ලබනවා. මෙයින් අදහස් වන්නේ නිවස, පාසල, රැකියා ස්ථානය ඇතුලු තමන් සිටින ඕනෑම ස්ථානයක් ධර්ම පුහුණු කරන ස්ථානයක් යන්නයි. කෙසේ වෙතත් මෙය ප්‍රායෝගිකව පුහුණු කිරීම අසීරු කාර්යයක් වනවා. එනිසා ධර්ම ශාඛාවන් ඉතා වැදගත් වේ.

※ කරුණාකර අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීමෙන් වළකින්න.

බුදුන්වහන්සේගේ මෙන් පොහොසත් හදවතින්

තමාට සමීපම පුද්ගලයන්ව දුකින් මුදවා ගනිමු

නික්යෝ නිවානෝ තුමා
නිර්මාතෘ, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය

ඒ වෙනුවෙන්, තමා සමීපයේ සිටින පුද්ගලයන්ගේ දුක් කරදර හඳුනාගෙන, ඔවුන්ව දුකින් මුදවාලීම පලමු පියවර වේ. මිනිසුන් රෝග පීඩාවන්ගෙන්, දිළිඳුකමින් හා යුධ ගැටුම්වලින් මුදවා ගැනීම පැරණි සිතුවිල්ලක් යැයි කල්පනා කරන පුද්ගලයන්ද සිටියි. නමුත් වර්තමානයේ නව ආකාරයෙකින් මෙම රෝග පීඩාවන්, දිළිඳුකම හා යුධ ගැටුම් මතු වෙමින් පවතී.

එම නිසා සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය නොකඩවා සජ්ඣායනය හා එහි විචාරණ අර්ථ කථනයද නැවත නැවත කියවා, අන්තර්ගත අරුථ අපගේ ශරීරයට බද්ධ කරගැනීම තුලින්, නිරන්තරයෙන් වෙනස්වන ලෝකයේ ස්වභාවය අවබෝධ කරගැනීමට හැකි ප්‍රඥව වඩවාගත යුතුය. එසේ නොමැතිව අප අවට සිටින පුද්ගලයන් එකිනෙකාගේ දුක් කම්කටොළු අවබෝධ කර ගැනීමට නොහැකිව. අවශ්‍ය ආකාරයට කටයුතු කිරීමට 'උපායකෞශල්‍ය' ද අවබෝධ නොවෙයි.

අවසානට පැවසිය යුතු වන්නේ, අන්‍යන්ට ධර්මය දේශනා කරන විට, එම අවස්ථාවේදීම ක්ෂණික ප්‍රථිපල නොලැබුනත්, එම තැනැත්තන්ගේ හදපත්ලේ 'බීජයක්' මෙන් එම ධර්ම කරුණු තැන්පත් වන බවයි. එසේ වපුරන ලද බීජය, කවද හෝ කුමන් අවස්ථාවකදී හෝ දළු ලා වැඩෙයි. ඒ බව විශ්වාස කර, දෙගිඩියාවෙන් තොරව, වෙහෙසට පත් නොවී බෝධිසත්ව චර්යයාවේ යෙදෙනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

නික්යෝ නිවානෝ තුමා විසින් රචිත,
'යහපත් බවේ බීජයන් වපුරමු' ග්‍රන්ථයේ 83 - 84 පිටු ඇසුරිණි

Director's Column

පොහොසත් හදවතක් හිමිකර ගැනීමට, සතර ආශ්‍රම ධර්ම ඉගෙන ගනිමු

කෙයිඉචි අකගාවා මහතා
රිෂ්ෂෝ කෝසෙයි කායි අන්තර්ජාතික මූලස්ථානය

සියළුදෙනාටම සුභ දවසක් වේවා. ජපානයේ ගිම්හාන කාලය දැඩි රශ්මියක් පවතිනවා. ඉදහිට හමන සිහිල් සුළඟට, ගිම්හානයේ සිට සරත් ඍතුවට වෙනස්වීමට තව වැඩි කාලයක් නොමැති බව දැනෙනවා. ඔබලා සියළුදෙනාම හොඳින් සිටිනවානේද.

නිචිකෝ නිවානෝ තුමාගේ මේ මස මාසික පණිවුඩය තුලින්, ජීවිතයේ සතර ආශ්‍රම ධර්ම ගෙනහැර දක්වමින්, අපගේ ජීවිතයද ඍතු වලට වෙන් කර දක්වා තිබෙනවා. එසේම ජීවිතය කාල වකවානු 4 කට වෙන් කර, හදවතින් පොහොසත් මනුෂ්‍යයකුවීමට අවශ්‍ය කරුණු පැරණි ඉන්දියානු 'සතර ආශ්‍රම ධර්ම' ගෙනහැර දක්වමින් පැහැදිලි කරදී තිබෙනවා.

එම ජීවන දර්ශනය ගැන මම මුලින්ම දැනගත්තේ ඉත්සුකි හිරොයුකි ග්‍රන්ථ රචක තුමාගෙනි. එතුමා රචනා කරතිබූ 'සතර ආශ්‍රම ධර්ම' ග්‍රන්ථය මම කියෙව්වේ වයස අවුරුදු හතලිස් ගනන් වලය. ජීවිතය බ්‍රහ්මචාර්ය අවධිය, ගෘහස්ථ අවධිය, වානප්‍රස්ථ අවධිය සන්‍යාස අවධිය ලෙසින් කාණ්ඩ හතරකට වෙන්කර, එකිනෙකට ආවේණික වූ ජීවන රටාවක් දේශනා කලත්, වර්තමාන සමාජය තුල ඒ ආකාරයටම කටයුතු කිරීම ශාරීරිකව හා ආර්ථිකමය වශයෙන් අසීරු කටයුත්තකි. නමුත් 'ආධ්‍යාත්මික සතර ආශ්‍රම ධර්ම' නම් ප්‍රායෝගිකව යෙදීමට හැකියැයි ඒ කාලයේ සිතුබව මට මතකයට පැමිණියා. ඒ ආකාරයට ජීවත්වීමට හැකිනම්, අපට හදවතින් ස්වාධීන වීමට හැකියැයි සිතුවෙමි.

නිචිකෝ සෙන්සෙයි විසින් මෙම සතර ආශ්‍රම ධර්ම වලට අදාල අපගේ ජීවිතයේ සරත් සමය ගැන, 'අපට පෙරදී කරදරකාරී ලෙස හැඟුණු දේවල් වලින් ක්‍රම ක්‍රමයෙන් නිදහස්ව, හදවත පුරවන දේවල් සහ අපේක්ෂාවන් මනසේ තබාගෙන, පැහැබර හැඟීමකින් ශීත සමයට පිවිසෙන කාලයයි' ලෙසින් කියාදුන්නා. වසන්තයේ, ගිම්හානයේ, සරත් සමයේ හා ශීත සමයේද ඒ ඍතු වලට ආවේණික වූ ඵලයන් තිබෙනවා. හදවතේ දුර්වල බවින් ශ්‍රද්ධාව අඩුකර නොගෙන, 'වර්තමානයේ තිබෙන්නේ අතීතයේ ප්‍රතිපලය සේ, වර්තමානය තුලින් අනාගතය නිර්මාණය කර ගැනීමට හැකි බව' හදවතට ධාරණය කරගෙන මේ මාසයේදීත් නිහතමානීබවෙන් හා කෘතවේදීත්වයේ හදවතින් ආධ්‍යාත්මික දියුණුව ඇතිකර ගනිමු.

නැගෙනහිර ආසියානු නායක සම්මන්ත්‍රණයට සහභාගී වූ
කොරියානු හා මොන්ගෝලියානු නායකයින්
මේ සදහා තායිවානයත් සහභාගී වී තුන් වරක් අන්තර්ජාලය හරහා පවත්වා,
හතරවෙනි වර ජපානයේ මූලස්ථානයේදී පැවැත්වීය.
2025 අගෝස්තු මස 2 දින

A Global Buddhist Movement



Information about local Dharma centers

facebook

X

We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp